20

# කාන්තාර ගමක උපත

**නන්දන වීරසිංහ - 1954**

80 දශකයේ කාව්‍ය ක්ෂේත්‍රයට පිවිස 90 දශකයේ දී ප්‍රකට කවියකු වූ නන්දන වීරසිංහ වර්තමානය දක්වා අඛණ්ඩ ව කාව්‍යකරණයෙහි නිරතවන්නෙකි. **ගිංගඟේ විලාපය** (1984) නම් කාව්‍ය සංග්‍රහය ප්‍රකාශයට පත් කරමින් කාව්‍ය ක්ෂේත්‍රයට පිවිසි මොහු **කිරිසුවඳැති රාත්‍රියක්** (1990) **සත්‍යකාම නම් වෙමි** (1994) **ගිරිග** (1997) **මහත් සඳ පිනි බිඳෙක** (2009) **සහස් රැස් යට** (2011) යන ස්වතන්ත්‍ර කාව්‍ය කෘති මෙන් ම **දිසි අදිසි** (2013) නමින් ඇමරිකා හයිකු කාව්‍ය පරිවර්තනයක් ද සිදුකර තිබෙයි.

ධනේශ්වර ක්‍රමයත් සමග සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ප්‍රපංචයන්හි සිදු වූ වෙනස්කම් ඉතා සියුම් ව ග්‍රහණය කරගනිමින් ගැඹුරු ජීවන දෘෂ්ටියකින් යුතු ව මානව හා සමාජ ජීවිත විවරණයෙහි නිමග්න වන නන්දන වීරසිංහගේ පද්‍ය සියුම් දේශපාලනික දෘෂ්ටියකින් යුක්ත වීම විශේෂත්වයකි.



සංක්ෂිප්තතාව කවියට ආරෝපණය කරමින් නව්‍ය කාව්‍ය ආකෘති පිළිබඳ අත්හදා බැලීම්හි නිරතවන මොහු, බටහිර හයිකු කවියෙන් ද ආභාසය ලැබූ කවියෙකු ලෙස හඳුනාගත හැකි ය.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රැස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දෙරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ මං පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන් ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

## ලිඛිත අභ්‍යාස

1. ආර්ථික වාසි අපේක්ෂාවෙන් මිනිසුන් කරන ක්‍රියාකාරකම නිසා ස්වභාව ධර්මයට වන හානිය අපූර්වත්වයෙන් ඉදිරිපත් කිරීමට නන්දන වීරසිංහ කවියාගේ 'කාන්තාර ගමක උපත' පද්‍ය පන්තිය සමත් වී ඇත. විමසන්න.

2. පද්‍යකරණයේ දී කවියා සතු ප්‍රතිභාව 'කාන්තාර ගමක උපත' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

3. 'කාන්තාර ගමක උපත' නිර්මාණයේ දී කවියා භාවිත කර ඇති ආකෘතිය හා භාෂා විලාසය පිළිබඳ ඇගයීමක් කරන්න.